*සැ. යු.* - 2018.08.31 වැනි දින පළ වූ අංක 2087 දරන *ගැසට් පත්‍රයේ* I : III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,088- 2018 සැප්තැම්බර් මස 07 වැනි සිකුරාදා - 2018.09.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :** | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 538 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 538 |


*සැ. යු.*-(i) යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ අය කරගැනීමේ පනත් කෙටුම්පත 2018 අගෝස්තු මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 සැප්තැම්බර් මස 28 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 සැප්තැම්බර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

537- B 081447 - 353 (2018/09)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

ඇමුණුම 09.

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

නැගෙනහිර පළාත් සභාවේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ජෝන් පිල්ලෙ සුසීන්ද්‍රන් අරුල්රාජ් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983.05.30 වැනි දින ප්‍රදානය කර ඇති අංක ත්‍රි/ප්‍ර/714 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අන්බුවලිපුරම් යන ලිපිනයේ පදිංචි, කන්දප්පර් එලියතම්බි වෙත ප්‍රදානය කොට ත්‍රිකුණාමලයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්ඩී/ඒ/02/14 යටතේ 1986.09.10 වැනි දින ලියාපදිංචි කර ඇත.

පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2018.09.30 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, නගර හා කඩවත් ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ නගර හා කඩවත් පත්තුවේ උප්පුවෙලි 243 ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ කො.අ.11, අභයපුර හා 12, අන්බුවලිපුරම් නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලබන ඔහු භාරයේ ඇති අංක එෆ්.වී.පී. 29 සප්ලිමන්ට් 10 දරන පිඹුරෙහි අංක 353 බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් අක්කර 00 රූඩ් 01 පර්චස් 00.2 ක් ඇතැයි ගණන් බලා තිබෙන කො.අ. 11 අභයපුර හා 12, අන්බුවලිපුරම් යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඉඩම් කැබලි අංක 352; |
| *නැගෙනහිරට* | : | ඉඩම් කැබලි අංක 361, 360; |
| *දකුණට* | : | ඉඩම් කැබලි අංක 354 1/2; |
| *බස්නාහිරට* | : | ඉඩම් කැබලි අංක 354 2/2. |

ජේ. එස්. අරුල්රාජ්,
ප්‍රාදේශීය ලේකම්,
නගර හා කඩවත්,
ත්‍රිකුණාමලය.

2018 මැයි මස 28 වැනි දින.

09 - 117

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/54432.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
එන්සීපී/පීඑල්සී/එල්2/15/02

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, අංක 286, මහබුලංකුලම ග්‍රාම නිලධාරි වසමේ මහබුලංකුලම ගමේ ඉඩම් නිළධාරි විසින් සකසන ලද දළ අනුරේඛනයේ කැබලි අංක 01 දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 06 දරන ඉඩම් කොටස සීමාරහිත මහබුලංකුලම සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | රජයේ ඉඩම; |
| *නැගෙනහිරට* | : | රජයේ ඉඩම; |
| *දකුණට* | : | මාර්ග රක්ෂිතය; |
| *බටහිරට* | : | රජයේ ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදුකාලය*: අවුරුදු තිහයි. (30) (2018.05.18 සිට ඉදිරියට) *වාර්ෂික බදු මුදල* :- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2018 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2018.05.18 දින සිට වසර 05ක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදාස,
*සහකාර* ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2018 සැප්තැම්බර් මස 07 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-118

---

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/56419.
*දකුණු පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ අංකය* :
නිඉකො/හම්/ඉ2/හම්/දී. බදු/214.

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිසිලසගම, අංක 124 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සිත්‍රාකල ගමේ අ.ග.පි. 66 පිඹුරේ කැබලි අංක 697 වන බිම් කැබැල්ල ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.3335 ක් වාණිජ කටයුතු සඳහා විජය මුණිගේ ප්‍රේමදාස මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 696 සහ අ.ග.පි. 54; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 698, 700 සහ අ.ග.පි. 54; |
| *දකුණට* | : | කැබලි අංක 698, 700 සහ 699; |
| *බටහිරට* | : | කැබලි අංක 700, 699 සහ 696. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2018.06.08 දින සිට වසර 30ක් ඉදිරියට);

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- 2018 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*දඩ මුදල*.- වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* බද්ද ක්‍රියාත්මක වන දින සිට වසර 05 ක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය පළ කරන දින සිට* සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එන්.පී. අමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2018 සැප්තැම්බර් මස 07 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි ,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09 - 119

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2018 වර්ෂය** | | | |
| **සැප්තැම්බර්** | 2018.09.07 | සිකුරාදා | 2018.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.09.14 | සිකුරාදා | 2018.08.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.09.21 | සිකුරාදා | 2018.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.09.28 | සිකුරාදා | 2018.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2018.10.05 | සිකුරාදා | 2018.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.12 | සිකුරාදා | 2018.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.19 | සිකුරාදා | 2018.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.26 | සිකුරාදා | 2018.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2018.11.02 | සිකුරාදා | 2018.10.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.11.09 | සිකුරාදා | 2018.10.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.11.16 | සිකුරාදා | 2018.11.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.11.23 | සිකුරාදා | 2018.11.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.11.30 | සිකුරාදා | 2018.11.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.